# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පොල් සංවර්ධන (සංශෝධන)

**1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් 2019 මාර්තු මස 19 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 පෙබරවාරි මස 18 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[275 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින්, මණ්ඩලය වෙත ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු පත්කර ගැනීම සඳහා (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට අදාළ කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස ප්‍රධාන ප්‍රඥප්තියට 2අ අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර, එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

එල්.ඩී.—ඕ. 28/2017

## 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2019 අංක     දරන පොල් සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1971 අංක 46 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) (ix) ඡේදයේ "පත්කිරීම; සහ" යන වචන වෙනුවට "පත්කිරීම;" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(2) එම උපවගන්තියේ (ix) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(ixඅ) 2අ වගන්තියේ විධිවිධානවලට අනුකූලව මණ්ඩලයේ සාමාජිකයකු නොවිය යුතු ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු පත්කිරීම; සහ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එකී ප්‍රඥප්තියේ 2අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:–

"මණ්ඩලයක ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා.

2අ. (1) මේ පනතේ 2 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවනු ලබන යම් මණ්ඩලයක් සඳහා අමාත්‍යවරයා විසින් පොල් සංවර්ධන ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති තැනැත්තන් අතරින් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා –

(අ) පූර්ණකාලීන නිලධරයකු විය යුතු ය;

(ආ) පොල් වගාකිරීම සහ අලෙවිකරණය සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීමේ දී සභාපතිවරයාට සහාය දැක්විය යුතු ය; සහ

(ඇ) මණ්ඩලයේ කටයුතු සම්බන්ධීකරණය කිරීම ඇතුළුව මණ්ඩලයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය හා ක්‍රියාත්මක කිරීමේ දී සභාපතිවරයාට සහාය ලබා දිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, ඒ සඳහා හේතු දැක්වීමෙන් පසු ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාගේ ධුර කාලය පත් කරනු ලබන දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා විය යුතු අතර, (3) වන උප වගන්තියේ සඳහන් පරිදි ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, නැවත පත්කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය. එම නැවත පත්කරනු ලැබීම අනුගාමී හෝ එසේ නොවුන ද වැඩිදුරටත් වූ එක් කාලසීමාවකට වඩා නොවැඩි විය යුතු ය.

(5) ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාගේ ධුරය, මියයෑම, (3) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හෝ තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතනු ලැබූ ලිපියක් මඟින් ඉල්ලා අස්වීම නිසා පුරප්පාඩු වන්නේ ය.

(6) රෝගාතුර වීම, දුබලතාවය හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට ස්වකීය ධුරයේ කටයුතු ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක දී අමාත්‍යාවරයා විසින් ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කළ යුතු ය.

(7) මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අදාළ රාජ්‍ය ව්‍යවසායය චක්‍රලේඛවල නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ යම් පාරිශ්‍රමික ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.